# පුංචි කුරුලු පවුල



මෙතුලි තස්නිකා කරුණාරත්න

# පුංචි කුරුළු පවුල

මෙතුලි තස්නිකා කරුණාරත්න

# පුංචි කුරුලු පවුල


## මෙතුලි තස්නිකා කරුණාරත්න

ලිපිනය : නො: 65/64,
හේවාහැට පාර,
තල්වත්ත,
මහනුවර.


කතෘගේ වෙනත් කෘති : සෙල්ලම් ගෙදර
දඟකාර අලි පැටියා
සිංදුයි බිංදුයි


ISBN අංකය : 978-624-206-926-5

ප්‍රථම මුද්‍රණය : 2023-11-15

# ~ පිදුම ~

මගේ ආදරණීය සමන්මලී ගුරුතුමියට

හා

මගේ පංතියේ සිටින සියළුම යෙහෙළියන්ට

ආදරයෙන් පුදමි.

# ~ ස්තූතිය ~

**මෙම පොත ලිවීමට**

**මට උදව් කළ හැම දෙනාටම**

**ස්තූතියි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම  යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමාගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්“ ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසල් කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


2023.11.01

ඔන්න එකෝමත් එක කැලෑවක පුංචි කුරුලු පවුලක් ජීවත් වුණා. මේ පුංචි කුරුලු පවුලේ හිටියේ කුරුලු අම්මයි, කුරුලු තාත්තයි, කුරුලු පැටියයි.



කුරුලු තාත්තා උදේට කැලෑවට ගිහින් පලතුරු, පුංචි සතුන් හොයාගෙන එනවා. ඒ වගේ ම කුරුලු අම්මයි, කුරුලු තාත්තයි අකුරු ලියන්න, කියවන්න, හොඳ වැඩ කුරුලු පැටියට කියා දුන්නා.



කුරුළු පැටියා ගොඩක්ම කන්න කැමති පලතුරු, දවසක් උදේ ම කුරුළු පැටියා නැගිටලා කෑම කන්න යනකොට ගෙදර පලතුරු ඔක්කොම ඉවර වෙලා.




කුරුලු පැටියා :- අම්මේ, අම්මේ තාත්තේ අපේ ගෙදර කෑම ඉවර වෙලා මොක ද කරන්නේ


කුරුලු අම්මා :- අයියෝ පුතේ ඔයාට දැන් බඩගිනිද?

කුරුලු පැටියා :- නෑ අම්මේ

කුරුලු තාත්තා :- හරි එහෙනම් අපි තුන්දෙනා ම ගිහින් කෑම හොයාගෙන එමු.



ඉතින් කුරුලු පවුල කෑම හොයාගන්නට කැලෑවට ගියා කුරුලු පැටියා කවදාවත් දැකපු නැති ලස්සන තැන් ගොඩක් දැක්කා. ඒ වගේ ම සත්තු ගොඩක් හිටියා. කුරුලු පැටියාට හරි ම පුදුමයි. මෙයාලා පලතුරු, පුංචි පුංචි සත්තු හොයාගෙන හරි ම සතුටින් ගෙදර යන්නට පිටත් වුණා.



අනේ මේ මොක ද අපේ ගෙදරට වෙලා තියෙන්නේ ගෙදර කැඩිලා. කුරුලු අම්මයි, කුරුලු තාත්තයි, කුරුලු පැටියයි ගොඩක් දුක් වුණා.


කුරුලු අම්මා :- අපි දැන් මොක ද කරන්නේ

කුරුලු පැටියා :- ඔව් අපි මොක ද කරන්නේ තාත්තේ

කුරුලු තාත්තා :- අපි අලුත් ගෙයක් හදමු

කුරුලු අම්මා :- හා ඒකනම් හොඳයි

කුරුලු පැටියා :- හා තාත්තේ



කුරුළු පවුල එකතු වෙලා කෝටු කෑලි කොළ එකතු කරලා පුංචි ලස්සන කුරුළු කූඩුවක් හැදුවා. කුරුළු පවුලට දැන් තිබුණාටත් වඩා ලස්සන ගෙදරක් තියෙනවා. කුරුළු පවුලට හරි ම සතුටුයි.




දවසක් දා ගෙදර කෑම ඉවර වුණා. කුරුලු අම්මයි, කුරුලු තාත්තයි කෑම හොයාගන්න කැලෑවට ගියා කුරුලු අම්මටයි, කුරුලු තාත්තටයි, කුරුලු පැටියාව ගේන්න අමතක වුණා. කුරුලු පැටියාව උකුස්සෙක් ඇවිත් අරගෙන ගියා. කුරුලු අම්මයි, කුරුලු තාත්තයි පලතුරු අරගෙන ගෙදර ගියා. ගිහින් බලනකොට පැටියා ගෙදර නෑ. කුරුලු අම්මටයි, කුරුලු තාත්තටයි පැටියා හම්බවුණේ නැහැ.මේ දෙදෙනාම දුකින් හිටියා.



එතකොට කුරුල්ලෙක් ඇවිත් කිව්වා ඔයාලාගේ පැටියාව උකුස්සෙක් අරන් ගියා කියලා.

කුරුලු අම්මයි, කුරුලු තාත්තයි වේගයෙන් පියාඹා ගියා. කුරුලු තාත්තා උකුස්සාව වෙන පැත්තකට අරගෙන ගිහින් අතරමං කළා. ඒ අතරේ කුරුලු අම්මා කුරුලු පැටියාව බේරගත්තා. කුරුලු අම්මයි. කුරුලු තාත්තයි කුරුලු පැටියයි ගෙදර ගියා.



කුරුලු අම්මා :- ආයෙනම් අපි ඔයාව තනි කරලා යන්නේ නැත. පැටියෝ

කුරුලු පැටියා :- හා අම්මේ

කුරුලු තාත්තා :- අපි ඔයාට ආදරෙයි පැටියෝ

කුරුලු පවුල සතුටින් ජීවත් වුණා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනාකරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක<br>
2023.11.01